Page 9 Aug-Sep 2012.qxd 24/09/2012 14:34 Page 1



# ලංකාවෙන් අතුගෑවී යන සිංහල බස

කිසියම් ජාතියක් සතු බස නැසුණොත් ඒ ජාතිය වැනසී යනු ඇත. අපේ ජාතිය ද දැන් මුහුණ පා සිටින්නේ ඒ තත්වයටදැයි සිතෙන තරමට සිංහල බස නසන්නෝ ලංකාව තුළ වැඩිවී සිටිති.

රට ජාතිය බාරගැනීමට සිටින බාල පරපුරට පරබස් ප්‍රගුණකරවා එමගින් හෙළබස නැසීමේ යටිකූට්ටු ව්‍යාපාරයක් ශ්‍රීලංකාවේ ක්‍රියාත්මක වෙමින් පවතී. මෙහි පෙරගමන්කරු වශයෙන් ඉන්ටර්නැෂනල් ස්කූල් හෙවත් ජාත්‍යන්තර පාඨශාලා හැඳින්විය හැකිය. මේ පාසැල්වල යටි පරමාර්ථය ශ්‍රීලංකාවේ යළි ඉංග්‍රීසිය රජකරවීම ය.

යමක් කමක් ඇති පවුල්වල උදවිය තම දරුවන් යවන්නේ මේ ඉන්ටර් නැෂනල් ඉස්කෝල වලටය. ඉංග්‍රීසි බැරිනම් හරිහමන් රස්සාවක් සොයාගන්නට බැරියයි ලාංකික සමාජය හඳුනාගෙන සිටියි. හැකි අය ඉන්ටර්නැෂනල් යද්දී, නැති බැරි අය කොහේ හෝ ඉංග්‍රීසි යාන්තමින් හෝ තළුමරාගත හැකි තැනකට යති. ඉංගිරිසිය අද ශ්‍රීලංකාවේ එතරම් තේජෝ බලසම්පන්න ය.

ඉහළ මධ්‍යම පන්තික පවුල්වල මුනුබුරු මිනිබිරියන් යර්ස් නෝ කියද්දී ආච්චිලා සීයලාද යර්ස් යර්ස් කියමින් තම උජාරුව පෙන්වති. තව ටික කලක් යනවිට සිංහල බස කතාකරන දරුවන් සොයාගන්නට එංගලන්තයට යාමට සිදුවනු නියතය. දෙමළ, මුස්ලිම් මිනිසුන් දෙමළ බසින් කතාකරද්දී සිංහළ මිනිසුන් ඉංග්‍රීසියෙන් කතාකරන විට සිංහළ බසට වන්නේ අභාවප්‍රාප්ත වන්නට නොවේද? අනගාරික ධර්මපාලතුමා, ඇස්. මහින්ද හිමියන් වැනි ජාති මාමකයන් පහළවිය යුත්තේ මේ කාලය ට ය.

කාලයක් තිස්සේ අප රටේ ප්‍රබල ජනමාධ්‍යයන් වන ශ්‍රීලංකා ගුවන් විදුලි සංස්ථාවත්. ශ්‍රීලංකා ජාතික රූපවාහිනියත් ලිඛිත බස අපූරුවට හසුරුවමින් ප්‍රවෘත්ති වැඩසටහන් ඉදිරිපත් කළාය. ඒ අතරට පැමිණි **සිරස** නම් ගුවන්විදුලි සේවය කටවහරෙන් ප්‍රවෘත්ති ඉදිරිපත්කිරීම ඇරඹුවාය. මෙය මහා විනාශයක් වූයේ එජාප ආණ්ඩුව පැමිණි පසුවය.

'සිරස' බෝකළ රෝගය රූපවාහිනියද බදාගත්තාය. ඔව්හු ද කටවහරින් ප්‍රවෘත්ති දෙන්නට පටන්ගත්හ. ලිඛිත බසෙන් ප්‍රවෘත්ති ඉදිරිපත් කළ නොහැක්කේ බසෙහි වරදක් නිසා නොවේ. ඒ වැඩසටහන් සම්පාදකවරුන්ගේ සහ ඉදිරිපත්කරන්නන්ගේ අදක්ෂකම් නිසා ය. ලෝකයේ මෙතරම් සුමට සුන්දර බසක් අද වට්ටි අම්මලාගේ බසක් බවට පත්කර තිබේ. මේ ගැන අපේ බස් ඇදුරෝද ඇස්, කන්, කට පියාගෙන සිටිති. සිංහළ බස එක එකාට ඕනෑ විදියට හසුරුවා විනාශ කරති.

මේ අතර තවත් වයිරසයක් දැන් තදින් පැතිරීගෙන යයි. එනම් සිහංළ වැඩසටහන් වලට ඉංග්‍රීසි මාතෘකා යෙදීම ය. ශ්‍රීලංකා ලයිෆ්, ලයිට් ඇට් එයිට්, ක්‍රයිම් වොච්, වැට් ඇන් රිදම්, ඉට්ස් මී... වැනි මාතෘකා වලින් ඉදිරිපත්කරන සිහළ වැඩසටහන් ගණනාවකි. හැබැටම මුන්ට පිස්සුද? අපේ රටේ මිනිස්සුන්ට හැදීගෙන එන මේ ඉංග්‍රීසි උණ කුමක්ද? තම බසට පණමෙන් සැලකිය යුතු නොවේද? ගරුකළ යුතු නොවේද? ඉංග්‍රීසි වැරැද්දුවහොත් රජා මැරීයයි සෝපාසයෙන් හිනාවෙන මිනිස්සු කිසි ලැජ්ජාවක් නැතිව සිහංලය අමුඅමුවේ මරාදමති.

පුවත්පත් මගින් හා විද්‍යුත් මාධ්‍යයෙන් සිංහළ බස නසන හැටි ප්‍රවීන මාධ්‍යවේදියෙකුවන ඩී. එෆ්. කාරියකරවන මහතා විසින් සිළුමිණ පත්‍රයට ලියන ලද ලිපි පෙළකින් පෙන්වා දෙනු ලැබීය. ඔවුන්ගේ ඒ ලිපි පෙළ පොතක් හැටියටද පළවී ඇත. අද පුවත්පත් කලාවේදීන් බස නසන හැටි බොහෝ පත්‍රවල පිටුවක් පිටුවක් පාසා දැක්වීමට පුළුවන.

කෙසේ වුවද බස හරිහැටි නොදන්නවුන්ගෙන් සිංහළ බසට හානි සුදුවන අතරේ බස දන්නා පඬිවරුන් වේදිකාවට ඉඳහිට හෝ පැමිණ බස වෙනුවෙන් නගන හඬ වැදගත්ය. එහෙත් එය ප්‍රමාණවත්දැයි සැක සිතේ. සිංහළ බසට ලැදි හිතෛෂීන් වඩාත් උනන්දුව කිසියම් ක්‍රියා මාර්ගයක් ගන්නේ නම් එය අප භාෂාවේ පැවැත්මටද, ඔපයට හා තේජසට ද හේතුවක් වෙනවා ඇත.

♦ ඩබ්. කේ. ඩී. නවරත්න Srilanka

## ලංකා ජනපතිගේ ඉන්දීය සංචාරය



සාංචි ස්තූපය

ඉන්දියාවේ මධ්‍ය ප්‍රදේශයේ සාංචි හි ඉදිකිරීමට කටයුතු යොදා ඇති බෞද්ධ අධ්‍යාපන පීඨයට සැප්තැම්බර් **21** වන දින කෙරෙන මුල්ගල තැබීමේ උත්සවය වෙනුවෙන් ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සහභාගිවීමට නියමිත ය. මෙම උත්සවයට භූතාන් රාජ්‍යයේ අගමැතිවරයාද, ඉන්දීය පාර්ලිමේන්තුවේ (ලෝක් සභාවේ) විපක්ෂ නායක සුෂ්මා ස්වරාජ් මහත්මියද සහභාගි වෙති.

අක්කර **100** ක භූමියක ඉදිවන මෙම දැවැන්ත බෞද්ධ පීඨය ලොව ඕනෑම දෙසකින් එන භික්ෂුවකට හෝ ගිහියෙකුට මනාව බුදුදහම අධ්‍යනය කිරීමට මහ සැලසෙන්නක් වන අතර මෙය ලංකාව සහ ඉන්දීය රජය, මධ්‍ය ප්‍රදේශයේ ආණ්ඩුව, සහ මහාබෝධි සංගමය යන ත්‍රිත්වයේ සාමුහිකත්වයෙන් ඉදිවන්නකි.

ශ්‍රීලංකා ජනාධිපතිවරයාගේ සංචාරයට දැනටම තමිල්නාඩුවේ විරෝධය පළකෙරෙමින් තිබේ. කරුණානිධි හා ජය ලලිතා ඇතුළු ඊළම් ලැදි සියළු කොටස් මෙම ආරාධනාව අවලංගු කරන ලෙස බලකරමින් ඉන්දීය රජයට පෙත්සම් යවා ඇත.

**Appreciation** Rev. Fr. George Quintus Perera

# A genuine patriot and nationalist

*By A. G. S. Kariyawasam* (Buddhist Publication Society)

**When the 'Svabhasha' medium was to be jettisoned at the beginning of 1953, He came forward to defend the 'svabhasha' medium in defiance of the authorities of his Church. He wrote an epoch-making article to Sunday Lankadeepa (30. 11. 52) on that issue which skyrocketed him to fame as a hero or as said in Sinhala, ' Swabhasha Veeraya'**

On January 19, 2002, morning this writer received a telephone call and the caller, speaking in an elderly and a respectable tone, identified himself as Rev. Fr. Quintus Perera from the Bishop's House, Chilaw. We had not known each other earlier. What prompted him to call me was a feature article of mine that appeared three days earlier in the Daily News wherein I had made a strong case for the adoption of the mother tongue of a person as his or her medium of instruction as a sure means of making way for a person's originality and creativity to blossom forth.

I had substantiated my thesis with supportive statements from the Buddha. This idea had caught up greatly with the priest as he himself was a great champion of it. On his request I sent him the photocopies of the original references of the Buddha's recommendation of the concept, with a covering letter.

Prompt came the reply wherein amid the cordial words of friendship based mainly on our common cause of svabhasha medium, were the following words, "My life's purpose is to see that the svabhasha language (Sinhala and Tamil) is made the medium of instruction in all schools. I elaborated this policy so far back as 1937 long before Dr. C.W.W. Kannangara worked that concept. Anyhow, it was he who got it implemented as government policy in 1943-1944.

When the svabhasha medium was to be jettisoned at the beginning of 1953, I came forward to defend the svabhasha medium in defiance of the authorities of my Church. I am sending you the historic and epoch-making article I published in the Sunday Lankadeepa of 30.11.1952 which is of much importance that it skyrocketed me into fame (for which I didn't care a damn) and made me launch what was called the 'Svabhasha satana' which gave me also the bouquet of 'Svabhasha veeraya' as I carried it forward to victory."

In the Lankadeepa article of 1952 he makes a very strong case for the Svabhasha medium, boldly criticising the so-called 'elite' school principals who opposed the move. His feeling for the Sinhala language, which happens to be his own mother tongue as well, is evident from his observation that in 1815 when Sinhala became replaced with English, the degree of sadness in the minds of the Sinhala people, whose language had been used without any let or hindrance from anywhere in all their writings, should have been very high.

He validly argues that education should be universalised through the mother tongue without confining it to the 'elite' schools through English, because then only that the true sons of the soil would have the opportunity of asserting themselves as independent and powerful personalities, able to think creatively and with originality. It is a nation-building process from the colonial past. With all this he always maintained that English being an international language, should be retained as the second language.

In a subsequent letter he says, "What I want the people to realise is that however, important the study of English is, the medium of instruction in all schools in Sri Lanka be Sinhala / Tamil should be pursued with vigour for the blossoming of the innate talents of students."

On his 88th birthday on Feb. 2nd 2002 when I greeted him saying 'Vive la Father' on the phone, I remember well how he suddenly became emotional and responded with profuse thanks. His academic qualifications speak for his erudition which, along with his kindness, vouchsafed by his juniors in the church, make him a shining example for this very rare combination of erudition and kindness. He has double BAs in Eastern and Western classics from the London University, while being a qualified attorney-at-law as well,in addition to the academic ornaments received from the Vatican.

He had enough ammunition to shatter any argument in defense of English as the medium of instruction in Sri Lanka. When the problem surfaced recently also he boldly spoke against it accusing the proponents as suffering from 'anglophaebia'. In his letter of February 2nd he says " I am getting too old for the fray. I rely on you to excert all your influence to see that the Svabhasha medium of education is not dropped." His Sinhala writing is quite chaste as proved by a few sentences he wrote to me as Sinhala New Year greetings.

In a letter dated 06-06-02 he says: " My excessive love for Sri Lanka and for the Sinhala people forced me to go hammer and tongs to defend them against.......Will the noble Sinhala people have a country to live and a language to boast of...?" and says that he stopped writing a strongly worded article to the press as he felt mentally exhausted in the process and the doctors had advised him to give up all intellectual work and to take rest for three months. Now, fate seems to have so decreed that he could just survive this period only by a few weeks before breathing his last. All the letters he wrote to me he had signed in Sinhala.

In the last letter he was able to write to me on 16-07-02 he becomes quite critical of the new political culture developing in the country and mourns the loss of the traditional moral system of the people.

Let us gratefully mourn his death for his sincerity of views on nationalism and patriotism and wind up this brief tribute to him by quoting Sir Walter Scott, who seems to have had this type of patriot in mind when he sang,

" Breathes there the man with
soul so dead
Who never to himself hath said
" This is my own my native land."

# සිංහල ඝාතනය

**මේ** පිටුවේ වම්පසින් තිබෙන සිංහළ හා ඉංග්‍රීසි ලිපි දෙක කියවන්න! සිංහළ ලිපිය ශ්‍රීලංකාවේ වෙසෙන ප්‍රවීන මාධ්‍යවේදී හා ලේඛක ඩබ්ලිව්. කේ. ඩී. නවරත්නයන් දැනට ලංකාවෙන් සිංහල බස අතුගෑවී යනහැටි පැහැදිලි කිරීමකි.

දෙවැනි ලිපිය මේ මෑතකදී දිවංගත සැබෑ දේශප්‍රේමියෙකු හා ජාති හිතෛෂියෙකු වන ගරු ජෝර්ජ් ක්වින්ටස් පෙරේරා පියතුමා ගේ ජීවිතය අගය කරමින් ඒ. ජී. එස්. කාරියවසම් ලේඛකයාණන් විසින් ලේක් හවුස් ඩේලි නිවුස් පත්‍රයට ලියන ලද්දකි.

මේ ලිපි දෙකම අපට ඉතා වැදගත්ය.

වයෝවෘද්ධ අසූවියේ සිටියත් ක්වින්ටස් පෙරේරා පියතුමා සිය අවසාන මොහොත දක්වාම ස්වභාෂා මාධ්‍යයට ලංකාවේ පාසැල්වල මුල්තැන දිය යුතුයයි දැඩිව ඇදහූ, ඒ ගැන නොයෙක් ලිපි ලේඛන ලියූ, එසේම වගකිවයුත්තන්ට ඇහැට ඇඟිල්ලෙන් ඇන බොහෝ කරුණු කාරණා පෙන්වාදුන් විද්වතෙකි. ඉංග්‍රීසි දෙවන බස හැටියට මිසක, එයට පළමු තැන දියයුතු නැති බවත්, සිංහළට පළමු තැන දිය යුතු බවත් එතුමෝ තදින් කියා සිටියහ. 1943-44 වසරේ ආචාර්‍ය සී. ඩබ්: ඩබ්: කන්නන්ගර මහතා ස්වභාෂා වෙන් ඉගැන්වීම රජයේ ප්‍රතිපත්තියක් ලෙස නීතිගත කරවන්නට පෙර 1937 දී පමණ සිය තරුණ වියේදී ක්වින්ටස් පෙරේරා පියතුමා ස්වභාෂා සටනට මුලපුරා සිටියේය. අනගාරික ධර්මපාලතුමා පෙන්වා දුන් අන්දමේ, ඉංග්‍රීසිය කරපින්නවාගත් කලු සුද්දන් නිසා රටට විය හැකි හානිය ක්වින්ටස් පෙරේරා පියතුමා ද වසර ගණනාවක් තිස්සේ සිය ලිපි ලේඛන මගින් පැහැදිලි කළේ ය.

ඒ හානිය අද අපේ ඇස් ඉදිරිපිටදීම ලංකාවේ සිදුවෙමින් පවතී. ලංකාවේ අද සිංහළ කාබාසිනිය කරන්නේ සිය මෝඩකම තහවුරු කරමින්ම ඉතා නිවට ලෙස ඉංග්‍රීසියට එල්ලී සිටීමට වෙර ගනිමිනි. මෙතරම් තුච්ඡ ලෙස ඉංග්‍රීසියට ගැතිකමක් හටගන්නේ කෙසේදැයි නොතේරේ. සුද්දන් ලංකාව පාලනය කළ කාලයටත් වඩා මව්බස පාගා දමන්නට ස්වදේශී සිංහළයා මෙතරම් දීනවීම පුදුමයකි. දැන් සිංහළයා සියරට දේ නොව " පිටරට දේ සිරි සැප දේ " යනුවෙන් සිතමින්, පිටරට යන්නට සිහින මවමින්, නොගියත් තම රටේම පිටරැටියෙකු සේ ජීවත්වන්නට ඇත්නම් යන සිතුවිල්ලෙන් යුතුව තම හැදියාව පහතට දමා, පරබසක කෑලි එහෙන් මෙහෙන් අහුලාගෙන, ඒවා තම කතා ව්‍යවහාරයේ වචන අතරට ඉතා සාඩම්බරයෙන් රුවා, සිය භාෂාව ද අමු අමුවේ මරමින් බටහිර සංස්කෘතිය කරපින්නවා ගෙන සිටියි. ලංකාවේ බොහෝ සිංහළ වැඩිහිටියන්ද දරුවන්ට උගන්වන්නේ ස්වදේශික දේ පහත්කොට සලකන්නටය. ඔවුන්ගෙන් රැකුල් ලබන බාල පරම්පරාව ද ඉංග්‍රීසියටම වන්දනා මාන කරති. තව ඉතාම කෙටි කලකින් ලංකාවේ සිංහළයයි කිවනොහැකි අමුතුම තුප්පහි ජාතියක් බිහිවනු නොඅනුමාන ය.

තම භාෂාව ගැන අභිමානයක් නැත්තා තම රටටටද ආදරය නැත්තෙකි. ඔහු තම භාෂාව හෙළාදකිමින් වෙනත් ජාතියකට අයත් බසක් ගැන ඉහළින් සිතයි නම් ඒ තැනැත්තා හෝ තැනැත්තිය කිසිදු වැදගැම්මකට නැති පරඬැලක් වැනිය. පරඬැලට ජීවයක් නැතිවා සේම පිටබසකට ලැදිවීම යනු සියතින් මුල් සිඳගැනීමකි. එවැනි මුල් සිඳගත් ජාතියක් දැන් ශ්‍රීලංකාවේ බිහිවෙමින් පවතී.

ඒ මුල් සිඳුණු ජාතියට අභිමානයක් නැත. සාරධර්ම ගැන තැකීමක් නැත. ඔවුන් දීනව අනුන්ගේ ඉඳුල් අහුලාගෙන කන තත්වයට ඉබේම වැටේ. අද ලංකාවේ සිංහළයා පත්ව ඇති ඉරණමට හේතුව මෙම දීනකම දිනෙන් දින වර්ධනය වීමයි. සිංහළ බසට ආදරය ඇති අය ඉදිරිපත්ව මෝඩ තකතිරු සිංහළයාගේ මොළේ පාදා ඔහු මෙම අතිශය අභාග්‍යසම්පන්න තත්වයෙන් මුදාගැන්මට හැකි සෑම උත්සාහයක් කළ යුතුව තිබේ.

♦ දයා ආනන්ද